**ජ්‍යොතිශය**
ASTROLOGY

- භාව කේන්ද්‍රය අනුව පලාපල කථනය
- කේන්ද්‍ර සෑදීම හා නැකත් සෑදීම
- පොරොන්දම් බැලීම හා විවාහ දෝෂ පරීක්ෂාකිරීම

සියළු ජ්‍යොතිශ කටයුතු සඳහා විමසන්න
ජ්‍යොතිර්වේදී
**දේවසිරි විද්‍යාරත්න** MA
90777523 / 0450 561 941




NAATI Translator
Sinhalese/English
සිංහල ඉංග්‍රීසි පරිවර්තන සහ
අනෙකුත් ලියකියවිලි කටයුතු

Nadie Kammallaweera
Tel : 0469 879 701
Email: nadiekammallaweera@gmail.com

# ජනපති හෙවත් නරපති

## (නර + ඉඳු =නරනිඳු/නිරිඳු)

මහා වංශයේ සඳහන් වන විදියට විජයගෙන් පටන් ගත් සිංහල රාජ වංශය ශ්‍රී වික්‍රමරාජ සිංහ දක්වා ම පැවතිනි. සිංහ නම් මං පහරන්නකු නිසා ඇතිවු සිංහබාහු සහ සිංහසීවලී දෙදෙනාට උපන් දරුවකු වු විජයයා තම මුත්තාගේ ගති සිරිත් ඇත්තෙක් විය. ඔහු ලංකාවට පිරිවර 700 ද සමඟ ගොඩ (බටුයේ) බැස්සේ අහම්බෙනි.

එදා තිබි නැවක කී දෙනකුට යා හැකි වි ද ? නැව් කීයක් ඔව්න් යොදා ගත්තා ද ? ඉන්දු, ආරාබි අංකර නොතිබි එදා 701 ක් ගනන් කෙලේ කෙසේ ද ? එදා සිදුවීම ලියා තැබුවේ කවරෙක් ද ? යනු සෙවීමට උවමනා නැත. විජයයා කුවේනිය සමඟ කතා බහ කෙලේ කවර බාසාවකින් ද යනුත් නුවමනා ප්‍රශ්නයකි. අපි ඔහුද නරපති නමින් හඳුන්වමු. මිනි සුන් නොසිටි යකුන් සහ වල් සතුන් පමනක් සිටි එදා ඔහු "පති" වූයේ ඔහු සමග ආ 700 ට ය.

මහීපාල, මිහිපල්, මිහිඳු යන වචනවලින් දෙන අර්තය නිදොස් යය් මම නොසිතමි. මිනිසුන් නැති බිමක/රටක "පාල" කෙනකු ඇති විය නොහැකි බැවිනි.

විජයගේ පටන් ශ්‍රී වික්‍රමරාජ සිංහ දක්වා රජුන් හෙවත් නරපතියන් රූකඩ වැනි පාලකයන් නොව විදායක බලතල සහිත පාලකයන් වූහය් සිතමි. ඔවුන්ට ඉහත් බලවතකු නොසිටි නිසා "නරපතියා දැහැමියක් වේවා" ය් ප්‍රාර්තනා කිරිම විනා කැරලි ගැසීම්, පෙලපාලි යෑම, උපවාස කිරිම මරු කටට පැනීමක් විය. එහෙයිනි. "දෙවෝ වස්සතු කාලෙන-රාජා භවතු ධම්මිකො" යන පාඨය ඇති වූයේ. නරපතියන් සතුරන් සමඟ යුද්ද කොට ඔව්න් ගේ රට අත්පත් කර ගැනීම හෝ තම රටත්, තනතුරත් රැක ගැනීම කල බව පෙනේ. සිහසුනට පත් නරපතියා/ජනපතියා අපරාජිතව - සිටින තෙක් යෙ-හෙන් සිටින තෙක් ඒ තනතුරේ වැජඹේ.

අද එය වෙනස් වී ඇත. නරපතියා ම අද අපි ජනපතියා නමින් හඳුන්වමු. නිදහස ලැබිමෙන් පසු පත් වූ අග්‍ර ආන්ඩුකාර වරු/ජනාදිපතිවරු නමට පමනක් පතිවරු වූහ. ඔවුන් පත් වූයේ අගමැතිවරායා විසිනි.

විදායක ජනපතිවරයකුට වුවමනා වූ විටක පාලිමේන්තුව විසුරුවා හැර තමාට අවනත ඇමති මඩුල්ලක් පත් කර ගෙන අදිකරන බලතල තමා සතු කර ගෙන යාව ජීව පාලකයකු විය හැකිය. හමුදාවේ විශ්වාසය ඇති තෙක් ඔහු නිරුපද්‍රැතය.
අද විදායක ජනපති තනතුර හොඳ සිහියෙන් කල යුතුය. විජේතුංග අගමැතිවරයාට ජනාදිපත්කම ලැබුනේ අහම්බෙනි. එහෙය්න් අගමැතිවරයාට වුව මනා නම් ජනපතිවීමට උපක්‍රමයක්ද යෙදිය හැකිය.

ජනපති තනතුර, අගමැති, ඇමති, මන්ත්‍රි තනතුරු ගරු තනතුරු ලෙස සලකා ඔව්න්ට වැටුප්-දීමනා නැති යුගයක් ඇති වුවහොත් එදාට සැබෑ ජනහිතකාමී සත්පුරුශයන් හඳුනා ගත හැකි ය. එදාට බලකාමයෙන් මත් වී පොර කන, උනුන් මරා ගන්නා සිරිත අවසන් වනු ඇත.

# සුබස් සිතිවිලි

## පස් ඉදුරන් (පසිදුරන්) සහ ස-ඉඳුරන් (සය්ඳුරන්)

ඇමීබා වැනි සතුන් හැර අනෙක් සතුන්ට ඉඳුරු පසක් ඇති බව කියති. ඇස් හෝ කන් නැති සතුන් ද සිටිතැය් විද්‍යාඥයන් කියන කතාවේ ඇත්ත නැත්ත උරගා බැලීමේ උවමනාවක් නැතත් මම ඒ මතය පිලිගනිමි. අපට ඇදහීම පිනිස බොරු ගොතා කීම උන්ගේ සිරිත නො වේ. ඉහේ සිට දෙපතුල් දක්වා හැම සතකුට ම සමක් ඇත. ඇරුනු ඇසක ඇති සිවිය සමක් විය හැකිදැය් මම නොදනිමි. සුලං පහසින් (ස්පර්ශ කරන) හැම තැනකම ඇත්තේ සමය්. කට තුල ඇත්තේ ද සමකි. දිවෙහි සිවිය හමක් දැය් කීමට මම නොදනිමි. සමින් වැසුනු සිරුර පුරා විවර (සිදුරු) සහිත ඉඳුරු සයක් ඇත. ඉන් ඇස්, කන්, නැහැය, මුව යන සතර ඔලුවේත්- ලිඟුව, ඇනිසය (සිංහල/සකු වචන මේ සඳහා යෙදීමට නොකැමැති මම ඒනස්-ඒනල්-රෙක්ටම් යන ඉංගිරිසි වචන දෙස බලා "ඇනිසි" සදා ගතිමි. ඒනස්-රෙක්ටම් එකම අදහස නොදෙන බව පෙනේ) කඳේත් පිහිටා ඇත.

හරි වුවත් වැරදි වුවත් 'සම' ඉඳුරක් සේ මම නොගනිමි. වෙදකු වෙදකම ගැන කතා බහ කරන විට මිස ඇනි සීයගැන හෝ ලිඟුව ගැනත් ඒවායේ කිස ගැනත් අප දොඩන්නේ ඉතා අඩුවෙනි. මල (පහ) කරනවා මුත්‍ර (පහ) කරනවා ලියන බසටත් බැද්දට යනවා, රෙනවා, දොට්ට (දොරට-එලියට) යනවා, චු කරනවා දොඩන බසටත් ගැනීම අපේ සිරිතය්.

ලිඟුව ගැන හෝ එහි කිස ගැන දෙඩීමට හෝ ලිවීමට අකමැති නිසා ස්පර්ශය/පහස සම හා බැඳුනු කිස හැටියට ගෙන ඇතැය් සිතමි. දියරක හැර අනෙක් හැම දේකම සුලඟට ඇරි ඇති ස්තිර හැඩයක් ඇති හැම දේකම සැකැස්ම එහි සමය්. සම, පොත්ත, සිවිය යන නම්වලින් කිය-වෙන්නේ එක් ම දේ වෙතත් බෝලයක සැර-යටියක වෙන් කර ගත හැකි සමක්-සිවියක් නැත.

ඇස්, කන්, නෑ (නැහැ) යන ඉඳුරුවල සිදුරු (විවර) දෙකක් බැගින් ඇතත් අනෙක් තැන්වල ඇත්තේ එක් සිදුර බැගිනි. එය්න් මුවත් ලිඟුවත් කිස දෙකක් සඳහා යොදා ගැනේ. හඬ පිට කරන අතර බත් පැන් තුලට ගැනීම මුවිනුත්, මූ පිට කරන අතර මෙව්නෙහි යෙදීම ලිඟුවෙනුත් කරනු ලැබේ. කුඩා අවදියේත්, මහලු අවදියේත් සත්තු මෙව්නෙහි නොයෙදෙති.

කඳෙහි ඇති ඉඳුරු දෙකින් කෙරෙන කිස එලියේ නොකිරිම මිනිසාගේ සිරිතය්. අනෙක් සතුන්ට එහි වෙනසක් නැත.

අප හැම විටම, වෙසෙසින් බන-දහම්-පින්කම්වලදී කියන පසිඳුරන් ගැන යලි සිතා බැලිය යුතුය.

මා මේ ලියවිල්ලෙන් කියන්නට තනන්නේ සතුන් ගේ සිරුරෙහි (ඉන්ද්‍රිය) ඉඳුරු සයක් ඇති බවත් එයට සම, පොත්ත, සිවිය, ලෙල්ල අයත් නොවන බවත් කීමටය.

සතුන් ගැන- සොබා දහම ගැන සිතන විට මිනිසා මෙව්න අද විකාරයක් කර ගෙන ඇති බව පෙනේ. ගනිකාවන් ගැන සිතන විටත් නිවත් (නිරුවත්) රූ ගැන සිතන විටත් ඒ පැහැදිලි වේ. එහෙත් ඒ අනිවාර්ය ය. ස්වාභාවිකය.

ඇස, කන, නැහැය, මුව, ලිඟුව, ඇනසිය යන ස-ඉඳුරන් සිත හා සිතිවිලි හා බැඳී ඇත. නයා ගේ හම දිරා පත් වේ. අපට නොදැනී අපේ සම ද දිරා පත් වි ගැලවී යය්. එය ඉඳුරක් නොවේ.




ඇස කන වී, කන් බිහිරි වී ජීවත් විය හැකිය. අනෙක් ඉඳුරු හතර අක්‍රීය වූ සතා ගේ අවසානය ඉතා ලඟය. නාසය අක්‍රිය වූ සතකුගේ අවසානය ක්ශනික ව සිදු වේ.

මගේ දැක්මේ සත්ත තේරුම් ගෙන මේ ගැන තම අදහස් දැක්වීම හොඳය. වාද කිරිමක් මට නුවුවමනා වුවත් විවිසුම් අගය කරමි. විමසුම් ඇසින් ලොව දෙස බැලීම කාටත් වැඩවත් විය හැක.

(මෛථුනය - මෙව්න, ඇනිසිය - ඒනස්/ඒනල්/රෙ-ක්ටම් නාශ - නැහැ - නෑ, වසුරු - වසුරනවා)

## SBS සිංහල සේවය

**SBS සිංහල සේවය සඳුදා, අගහරුවාදා, බ්‍රහස්පතින්දා, සිකුරාදා
පෙ.ව 11 සිට 12 දක්වා**

සජීවව online අහන්න
www.sbs.com.au/radio - select - SBS radio 2 -Sinhalese

පසුව online අහන්න
www.sbs.com.au/sinhalese

සජීවව on TV - Channel 38

**සජීවව** on Radio

93.1fm - Victoria
97.7fm - NSW
105.5fm - Canberra
106.3fm - SA
93.3fm - QLD
96.9fm - WA

සජීවව හෝ පසුව via Mobile
SBS Radio APP - free download

SBS සිංහල Facebook පිටුව
www.facebook.com/sbssinhalese

කතාකරන්න - (03) 99492169

Fax කරන්න - (03) 99492385

කෙටි පණිවිඩ සඳහා - 042 999 6263
(වැඩසටහන ප්‍රචාරය වන වෙලාවේදී පමණි)

**සන්නස නව ගිණුම් අංකය**

සන්නස පුවත්පතේ වෙළඳ දැන්වීම් සඳහා ගෙවීම්
පහත දැක්වෙන සන්නස නව ගිණුමට ගෙවන්න

Sannasa Media

**Account Name - Sannasa Media**
Bank - Westpac
BSB Number - 033 341
Account Number - 590847